සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education NWP

33 | S | I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 12 - 2019

විභාග අංකය ....

ගිණුම්කරණය I

කාලය පැය දෙකයි

උපදෙස්

- ♦ අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ♦ අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ♦ සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.
- ♦ විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

ප්‍රශ්න අංක	ලකුණු
01 - 30	
31 - 50	
එකතුව	

01. පහත දැක්වෙන කුමන ප්‍රකාශය ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ මූලික කාර්යයභාරය සම්බන්ධයෙන් නිවැරදිවේ ද?

1. එය ආයතනයක් පිළිබඳව ඇල්මක් දක්වන පාර්ශවයන්ගේ භාවිතය සඳහා පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.
2. එය ආයතනයක් පිළිබඳව ඇල්මක් දක්වන පාර්ශවයන්ගේ භාවිතය සඳහා විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.
3. එය ආයතනයක කළමනාකරුවන්ගේ භාවිතය සඳහා පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.
4. එය ආයතනයක ගණුදෙනු, මුදල් පදනම මත ගිණුම් පොත්වල වාර්තා කරයි.
5. එය ආයතනයක අයිතිකරුවන්ට තීරණ ගැනීම සඳහා අතීත සහ අනාගත තොරතුරු සපයයි. (.......)

02. කළමනාකරණ ගිණුමකරණය සම්බන්ධයෙන් පහත දී ඇති කුමන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

A - ව්‍යාපාරයක මෙහෙයුම් කටයුතු සැලසුම් කිරීමට, සුපරීක්ෂණය කිරීමට හා පාලනයට යොදා ගනී.

B - බාහිර පාර්ශවයන්ට ඔවුන්ගේ තීරණ ගැනීම හා පාලනයට තොරතුරු සම්පාදනය කරයි.

C - ආයතනයේ කළමනාකරණ තොරතුරු පද්ධතියේ කොටසකි

D - රජයට නීතිමය අණපනත් සකස් කිරීමට එම තොරතුරු ලබාගත හැකිය.

1. A පමණි 2. D පමණි 3. A හා C පමණි 4. A,C,D පමණි 5. ඉහත සියල්ලම (.......)

03. රු. 1,000,000 ක් වැය කර ව්‍යාපාර ගොඩනැගිල්ල වායුසමනය කරන ලදි. මෙම ගණුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්වන්නේ,

1. රු.1,000,000 කින් වත්කම් අඩුවීම සහ රු. 1,000,000 කින් වත්කම් වැඩිවීම.
2. රු. 1,000,000 කින් වත්කම් අඩුවීම සහ රු. 1,000,000 කින් හිමිකම් අඩුවීම
3. රු. 1,000,000 කින් වත්කම් අඩුවීම සහ රු. 1,000,000 කින් වගකීම් අඩුවීම
4. රු. 1,000,000 කින් වත්කම් අඩුවීම සහ රු. 1,000,000 කින් වගකීම් වැඩිවීම
5. රු. 1,000,000 කින් වත්කම් අඩුවීම සහ රු. 1,000,000 කින් වියදම් වැඩිවීම (.......)

04. ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ ගැනිලි සහ අමතර ප්‍රාග්ධනය යෙදවීමක් නොමැති විට එම කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපාර ආයතනය නියත වශයෙන්ම ලාභයක් පෙන්නුම් කරනුයේ පහත සඳහන් කුමන අවස්ථාවේදී ද?

1. කාලපරිච්ඡේදය අවසානයේදී කාරක ප්‍රාග්ධනය අඩුවන අවස්ථාවක
2. මුළු වගකීම්වල වැඩිවීමට වඩා මුළු වත්කම්වල වැඩිවීම වැඩිවන අවස්ථාවක.
3. කාලපරිච්ඡේදය අවසානයේදී මුළු වගකීම්වලට වඩා මුළු වත්කම් වැඩිවන අවස්ථාවක
4. කාලපරිච්ඡේදය තුළ මුළු වගකීම් වැඩිවන අවස්ථාවක
5. කාලපරිච්ඡේදය තුළ මුළු වත්කම් වැඩිවන අවස්ථාවක. (.......)

05. ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු කිහිපයක් පොදු ලෙජරයේ ගිණුම්වල පිටපත් කර තිබූ ආකාරය පහත දැක්වේ.

ගනුදෙනු අක්ෂරය	ගනුදෙනුව	හර කළ ගිණුම	බැර කළ ගිණුම
A	මෝටර් රථයක් අත්පිට මිලදී ගැනීම	මෝටර් රථ	මුදල්
B	ණයගැතියෙකුගෙන් චෙක්පතක් ලැබීම	මුදල්	ණයගැති පාලන
C	විකුණූ භාණ්ඩ ආපසු එවීම	ආපසු එවුම්	ණයගැති පාලන
D	ගැණුම් ආපසු යැවීම	ආපසු යැවුම්	ණයහිමි පාලන

ඉහත ගනුදෙනු ඇසුරෙන් ද්විත්ව සටහන් ක්‍රමයට අනුව, නිවැරදිව ගිණුම්ගත කර ඇති ගනුදෙනු වන්නේ,

1. A,B සහ D ය. 2. B,C සහ D ය. 3. A,Bසහ C ය. 4. A සහ D ය. 5. B සහ D ය.(.......)

06. ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු හා සිද්ධි කිහිපයක් පහත දක්වා ඇත.

A - අයිතිකරු මුදල් ගැනිලි සිදුකිරීම
B - උපචිත වියදම් සටහන් කිරීම
C - ණයට ගත් භාණ්ඩ ආපසු යැවීම

ඉහත ගණුදෙනු හා සිද්ධි වාර්තා කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලියවිලි අනුපිළිවෙල වන්නේ,

1. ගෙවීම් වවුචරය, ජර්නල් වවුචරය හා බැරපත
2. ජර්නල් වවුචරය, ජර්නල් වවුචරය හා හරපත
3. ජර්නල් වවුචරය, ගෙවීම් වවුචරය හා හරපත
4. ගෙවීම් වවුචරය, ජර්නල් වවුචරය හා හරපත
5. ජර්නල් වවුචරය, ගෙවීම් වවුචරය හා බැරපත (.......)

07. පහත දැක්වෙන කුමන ගනුදෙනුව ආයතනයක ගැණුම් ජර්නලයෙහි සටහන් කරනු ලබයි ද?

1. දේපල, පිරියත හා උපකරණ ණයට ගැනුම්
2. වෙළඳ භාණ්ඩ අත්පිට ගැණුම්
3. දේපල පිරියත හා උපකරණ සහ වෙළඳ භාණ්ඩ ණයට ගැණුම්
4. දේපල පිරියත හා උපකරණ අත්පිට ගැණුම්
5. වෙළඳ භාණ්ඩ ණයට ගැනුම් (.......)

08. ගිණුම් වර්ෂයක් අවසානයේ දී පිළිවෙලින් ශේෂ පියවනු ලබන්නේ සහ ඉදිරියට ගෙනයනු ලබන්නේ පහත සඳහන් කුමන ගිණුම් වර්ග යුගලයද?

	පියවන	ඉදිරියට ගෙන යන
1	වත්කම්	වගකීම්
2	ආදායම්	වත්කම්
3	වගකීම්	ආදායම්
4	වියදම්	ආදායම්
5	හිමිකම්	වියදම්

(.......)

09. පහත දැක්වෙනුයේ සාමාන්‍යයෙන් භාවිත වන ගිණුම් කිහිපයකි.

(a)- ලැබිය යුතු රක්ෂණ වන්දි (b) - ගෙවිය යුතු එකතු කළ අගය මත බදු
(c)- මෝටර් රථ සමුච්චිත ක්ෂය (d) - ගැනිලි
(e)- රඳවාගත් ඉපයුම්

ඉහත ගිණුම්වල නිවැරදි වර්ගීකරණය දක්වනුයේ පහත පිළිතුරු අතුරෙන් කුමකින් ද?

	වත්කම්	වගකීම්	හිමිකම්
1	(e)	(b) (c)	(a) (d)
2	(a)	(b) (d)	(c) (e)
3	(b)	(c) (e)	(a) (d)
4	(a) (c)	(b)	(d) (e)
5	(a) (e)	(b) (c)	(d)

(.......)

10. ව්‍යාපාරයක සුළු මුදල් සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- 2019.06.01 දිනට සුළු මුදල් භාරකරු අත ඇති මුදල රු. 800 යි.
- 2019.06.01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම රු. 4200 යි.
- 2019.06.30 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 500 යි.

මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම සහ ජූනි මාසයේ සුළු මුදල් වියදම පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

	රු.		රු.
1	4200	හා	2900
2	4200	හා	3700
3	4700	හා	3700
4	5000	හා	4800
5	5000	හා	4500

(.......)

11. 2019.06.30 දිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය රු. 300,000 ක් වූ නමුත් එය මුදල් පාලන ගිණුමේ ශේෂය සමග එකඟ නොවීය. පසුව පහත දෑ අනාවරණය විය.

- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්වල අගය රු. 60,000 කි.
- නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත්වල අගය රු. 90,000 කි.
- මුදල් පාලන ගිණුමේ සටහන් නොවූ ණයගැති ප්‍රේෂණ රු. 25,000 ක් වන අතර බැංකු ගාස්තු රු. 5000 කි.

බැංකු ප්‍රකාශනය ලැබීමට පෙර මුදල් පාලන ගිණුමේ පැවති ශේෂය වන්නේ,

1. රු. 240,000 කි. 2. රු. 250,000 කි. 3. රු. 260,000 කි. 4. රු. 265,000 කි. 5. රු. 270,000 කි.(.......)

12. දසුන් ව්‍යාපාරය, එහි ප්‍රයෝජනය සඳහා මිලදී ගත් නීත්‍යානුකුල අයිතිය ඇති වත්කම් පමණක් නොව කල්බදු ක්‍රමයට ගන්නා ලද දේපල ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් ලෙස ඇතුළත් කරයි. මෙයට අදාල වන ගිණුම්කරණ සංකල්පය වනුයේ,

1. ආරක්ෂණ සංකල්පය
2. උපලබ්ධි සංකල්පය
3. ගැලපුම් සංකල්පය
4. ගිණුම්කරණ යථාරූපී බව
5. ඓතිහාසික පිරිවැය සංකල්පය (.......)

13. වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය මත, හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම සිදු කිරීමේදී අදාළ වන ගිණුම්කරණ සංකල්පය හෝ සංකල්ප වන්නේ,

A - ගැලපුම් B - අඛණ්ඩ පැවැත්ම C - ආරක්ෂණ

1. A පමණි 2. B පමණි 3. A හා C පමණි 4. A හා B පමණි 5. A,B හා C යන සියල්ලම (.......)

14. ව්‍යාපාරයක අනාගතයේදී ඇතිවිය හැකි ආදායම් ගිණුම්ගත නොකර, අනාගතයේදී ඇති විය හැකි වියදම් පමණක් ගිණුම්ගත කිරීමට අදාළ ගිණුම්කරණ සංකල්පය වනුයේ,

1. ආරක්ෂණ
2. ඓතිහාසික පිරිවැය
3. මූල්‍ය මිණුම්
4. සංගතතාව
5. ගැලපුම් (.......)

15. ගැණුම් වියදමක් ලෙස ගිණුම් ගත කළ ද එය සත්‍ය වශයෙන් වියදමක් වන්නේ, පහත කුමන අවස්ථාවේදී ද?

1. භාණ්ඩ මිලදී ගත් අවස්ථාවේ දී
2. භාණ්ඩ විකුණූ අවස්ථාවේ දී
3. භාණ්ඩ වලට මුදල් ලැබෙන අවස්ථාවේ දී
4. භාණ්ඩ ගබඩාවෙන් පිටකළ අවස්ථාවේ දී
5. භාණ්ඩ ගබඩාවට ලැබුණු අවස්ථාවේ දී (.......)

16. සීමිත පැතුම් සමාගම එහි පොදු ලෙජරයේ ඇති වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමෙහි ශේෂය හා උප ලෙජරයෙහි ශේෂ ලැයිස්තුවේ එකතුව අතර පහත සඳහන් සැසඳීම, ආධුනික ගිණුම් ලිපිකරු විසින් පිළයෙල කර ඇත.

	රු.
වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ ශේෂය	650,000
විකුණුම් ජර්නලයෙන් අත්හැරී ඇති ඉන්වොයිසිය	35,000
	685,000
පෞද්ගලික ගිණුමක අත්හැරී ඇති වට්ටම්	(15,000)
පාලන ගිණුමේ සටහන් නොවූ වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ	(7,000)
	663,000

සීමිත පැතුම් සමාගමෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ ලැබිය යුතු දෑ ලෙස දැක්විය යුතු වටිනාකම වන්නේ,
1. රු. 637,000 2. රු. 650,000 3. රු. 663,000 4. රු. 678,000 5. රු. 685,000 (.......)

- **අංක 17 සහ 18 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක 2019.03.31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය රු. 400,000 ක් වූ අතර ණයහිමි ලෙජරයේ ශේෂ එකතුව ඊට වඩා වෙනස් විය. පසුව පහත කරුණු අනාවරණය කර ගන්නා ලදී.

(i) රු. 175,000 ක ණයට ගැණුම්, ගැණුම් ජර්නලයේ සටහන් කර තිබුණේ රු. 265,000 ක් ලෙසය. මෙය ණයහිමි ලෙජරයේ නිවැරදිව සටහන් කර ඇත.

(ii) ණයහිමි ලෙජරයෙන් ශේෂ උපුටා ගැනීමේදී රු. 25000 ක ශේෂයක් මගහැරී ඇත.

(iii) රු. 100,000 ක ආපසු යැවුම් ණයහිමි ලෙජරයේ අදාල ගිණුමට බැර කර ඇත.

(iv) ණයහිමියන් සඳහා ගෙවූ රු. 210,000 ක් ණයහිමි පාලන ගිණුමේ සටහන් කර නොමැත. එය ණයහිමි ලෙජරයේ සටහන් කර ඇත.

17. ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ණයහිමි ලෙජර ශේෂ එකතුව වන්නේ,

1. රු. 175,000 කි. 2. රු. 190,000 කි. 3. රු. 200,000 කි. 4. රු. 210,000 කි. 5. රු. 275,000 කි. (.......)

18. 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිරූපනය කළ යුතු ණයහිමි ශේෂය වන්නේ,
1. රු. 60,000 කි. 2. රු. 75,000 කි. 3. රු. 90,000 කි. 4. රු. 100,000 කි. 5. රු. 110,000 කි. (.......)

19. මල්ෂාගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ එකතුව අසමාන වූයෙන් වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කර, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. අවිනිශ්චිත ගිණුමේ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඇතුලත් කර ඇත.
කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයේ දැක්වූ ශුද්ධ ලාභය රු. 150,000 කි. පසුව කරන ලද පරීක්ෂාවකදී පහත වැරදි හා අත්හැරීම් අනාවරණය වී ඇත.

i. ආපසු යැවුම් රු. 20,000 ක් ණයහිමි පාලන ගිණුමට පමණක් සටහන් වී ඇත.

ii. රු. 5000 ක් වූ රක්ෂණ වාරිකය ගෙවීම, රක්ෂණ ගාස්තු සහ මුදල් යන ගිණුම් දෙකටම බැර වී තිබීම.

iii. රු. 4000 ක බොල්ණය කපා හැරීම, ණයගැති පාලන ගිණුමට සටහන් කර නැත.

නිවැරදි ශුද්ධ ලාභය හා අවිනිශ්චිත ගිණුමෙහි පැවති ශේෂය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

	නිවැරදි ශුද්ධ ලාභය (රු.)	අවිනිශ්චිත ගිණුමේ ශේෂය (රු.)	
1.	159,000	9,000	(බැර)
2.	159,000	11,000	(හර)
3.	160,000	14,000	(බැර)
4.	160,000	14,000	(හර)
5.	161,000	24,000	(බැර)

(.......)

20. උප ලෙජරයක් පවත්වා ගැනීමේ අරමුණක් නොවන්නේ මින් කුමක් ද?

1. පොදු ලෙජරය අනවශ්‍ය ලෙස විශාල වීම වැලැක්වීම
2. වැරදි සිදුවීමට ඇති ඉඩකඩ ප්‍රමාණය අවම කිරීම.
3. ශේෂ පිරික්සුම ඉතා දීර්ඝ වීම වැලැක්වීම
4. ගිණුම්කරණ කටයුතු කිහිප දෙනෙකු අතර බෙදා හැර අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම.
5. ගිණුම් තැබීමේ පිරිවැය අවම කිරීම (.......)

21. දේශාන් සමාගම පිරිවැය මත 25% ක දළ ලාභයක් සහිතව භාණ්ඩ අලෙවි කරයි. 2019.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාල තොරතුරු පහත දැක්වේ.

	(රු.000)
ආරම්භක තොගය	300
අවසාන තොගය	250
ගැණුම්	1200
තීරුබදු හා ගෙන ඒමේ කුලී	150
විකුණුම් මත කොමිස්	200

2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ විකුණුම් වටිනාකම කොපමණ ද?

1. රු. 1,550,000 කි. 2. රු. 1,750,000 කි. 3. රු. 1,800,000 කි.
4. රු. 1,950,000 කි. 5. රු. 2,000,000 කි. (.......)

22. 2019 ජූනි මාසය සඳහා අමිල සමාගමේ සේවකයින්ගේ ශුද්ධ වැටුප රු. 460,000 ක් විය. සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේව්‍ය හා සේවක දායකත්වයන් පිළිවෙලින් 15% ක් හා 10 % ක් වේ. සේවා නියුක්ත භාර අරමුදලට (ETF) දායකත්වය 3% කි. මාසය තුලදී සේවකයින්ගෙන් වැටුපෙන් අයකළ ණය වාරික ප්‍රමාණය රු. 80,000 කි. EPF හා ETF දායකත්වයන් දළ වැටුප මත ගණනය කරයි.

2019 ජූනි මාසය සඳහා දල වේතනය හා සමාගමේ සේවකයින්ට අදාල මුළු වියදම කොපමණ ද?

	දළ වේතනය (රු.)	සේවකයින්ට අදාල මුළු වියදම (රු.)
1.	460,000	600,000
2.	511,000	618,000
3.	540,000	690,000
4.	590,000	540,000
5.	600,000	708,000

(.......)

23. සාමාන්‍ය තත්ත්වයන් යටතේ ඉඩම් ක්ෂය නොකිරීමට හේතුව කුමක් ද?

1. ඉඩම්වල වටිනාකම නිවැරදිව ඇස්තමේන්තු කළ නොහැකි බැවිනි.
2. ඉඩම්වල ඵලදායී ජීව කාලය අසීමිත වන බැවිනි.
3. ඉඩම්වල වටිනාකම කාලයත් සමග වැඩිවන බැවිනි.
4. ඉඩම්වල භාවිතයත් සමඟ එහි ගෙවීයාම් හා වැහැරීම් සිදු නොවන බැවිනි.
5. සියළු ඉඩම් සතුව සමාන ඵලදායී ජීව කාලයක් ඇති බැවිනි. (.......)

24. 2019.03.31 දිනට සමාගමක පැවති තොගය ගින්නක් හේතුවෙන් සම්පූර්ණයෙන්ම විනාශ විය. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු දී ඇත.

	(රු.000)
2008.04.01 දිනට තොගය	6000
ගැණුම්	14000
විකුණුම්	19200
ආපසු යැවුම්	2000
විකුණුම් වියදම්	2400

සමාගමේ ප්‍රතිපත්තිය වන්නේ පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් සහිතව භාණ්ඩ විකිණීමයි.
2019.03.31 දින විනාශ වූ තොගයේ වටිනාකම කොපමණද?

1. රු. 2,000,000
2. රු. 2,640,000
3. රු. 3,000,000
4. රු. 4,640,000
5. රු. 6,000,000

(.......)

25. එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වූ ව්‍යාපාරයක 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

	(රු.000)
විකුණුම් (VAT සහිත)	460
ගැණුම් (VAT සහිත)	230
2018.04.01 තොගය (පිරිවැය)	60
2019.03.31 තොගය (පිරිවැය)	40

VAT අනුපාතය 15% කි.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ දළ ලාභය කොපමණද?

1. රු. 180,000 කි.
2. රු. 190,000 කි.
3. රු. 200,000 කි.
4. රු. 210,000 කි.
5. රු. 220,000 කි.

(.......)

26. පහත සඳහන් කුමන සමීකරණය ආයතනයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා නිවැරදි වේද?

1. ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය + නිෂ්පාදන නොවන පොදු කාර්යය පිරිවැය
2. ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය
3. ඍජු අමුද්‍රව්‍ය පිරිවැය + ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය
4. ප්‍රාථමික පිරිවැය + මුළු පොදු කාර්ය පිරිවැය - නිෂ්පාදන නොවන පොදු කාර්යය පිරිවැය
5. ඍජු අමුද්‍රව්‍ය පිරිවැය + ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය (.......)

27. අසිත විසින් රු. 300,000 ක් හා තුසිත විසින් රු. 200,000 ක් ප්‍රාග්ධනය ලෙස යොදවා 2018.04.01 දින ආරම්භ කළ හවුල් ව්‍යාපාරයේ පහත කොන්දේසි ඇතුළත්ව තිබුණි.

- ලාභාලාභ සමසමව බෙදා ගැනීම
- හවුල්කරුවන්හට ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත වාර්ෂිකව 10% ක පොලියත් හිමිවීම.

2019.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් ශේෂ පහත පරිදි විය.

	(රු.)
මුළු වත්කම්	900,000
මුළු වගකීම්	300,000

2019.03.31 දිනට අසිත ගේ මුළු හිමිකම කොපමණද?

1. රු. 300,000 කි.
2. රු. 315,000 කි.
3. රු. 335,000 කි.
4. රු. 350,000 කි.
5. රු. 355,000 කි.

(.......)

28. මෛත්‍රී සුභසාධක සංගමයේ පහත තොරතුරු ඔබට ලබාදී ඇත.

	(රු.000)
2018.04.01 දිනට ජංගම නොවන වත්කම්	1220
2018.04.01 දිනට සමුච්චිත අරමුදල	710
2018.04.01 දිනට ගොඩනැගිලි අරමුදල	450

සුභසාධක සංගමය විසින් 2018.10.01 දින වන විට රු. 390,000 ක් ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතුවලට වැය කර ඇත.

මෙම සිදුවීම නිසා 2019.03.31 දිනට සංගමයේ පැවතිය යුතු සමුච්චිත අරමුදල හා ගොඩනැගිලි අරමුදල දැක්වෙන්නේ, (ක්‍ෂය නොසලකා හරින්න.)

	සමුච්චිත අරමුදල (රු.)	ගොඩනැගිලි අරමුදල (රු.)
1.	710,000	60,000
2.	710,000	450,000
3.	1100,000	60,000
4.	1100,000	390,000
5.	1160,000	450,000

(.......)

29. ලාභ අරමුණු කරනොගත් සංවිධානයක මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස සැලකිය නොහැක්කේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
1. හිඟහිටි සාමාජික මුදල්
2. ඉදිරියට ගෙවූ සාමාජික මුදල්
3. මෙහෙයුම් කටයුතු සඳහා මිලට ගත් මෝටර් රථය
4. කලින් ගෙවීම්
5. මාර්ගස්ථ භාණ්ඩ

(.......)

30. පහත තොරතුරු සීමිත අකිල පොදු සමාගමේ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාල වේ.

	(රු.000)
2018.04.01 දිනට වෙළඳ ගෙවිය යුතු දෑ	80
2019.03.31 දිනට වෙළඳ ගෙවිය යුතු දෑ	120
ආපසු යැවුම්	230
ගැණුම්	9200
ලද වට්ටම්	100
කල් ඉක්මවූ ණය සඳහා අයකළ පොලිය	40

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ වෙළඳ ගෙවිය යුතු දෑ වෙනුවෙන් ගෙවූ මුදල වන්නේ,
1. රු. 7,700,000 කි.
2. රු. 8,790,000 කි.
3. රු. 8,870,000 කි.
4. රු. 8,970,000 කි.
5. රු. 9,200,000 කි.

(.......)

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. මූල්‍ය ගිණුම්කරණයට අදාලව පහත ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න.

	ප්‍රකාශය	සත්‍ය / අසත්‍ය
A	එමගින් ව්‍යාපාරයක අතීත තොරතුරු සපයයි	....
B	එමගින් ව්‍යාපාරයක අභ්‍යන්තර පාර්ශවයන්ට පමණක් තොරතුරු සපයයි	....
C	සපයනු ලබන තොරතුරු ගිණුම්කරණ ප්‍රමිතවලට අදාලව සැපයිය යුතුය.	....
D	සමාගම් සඳහා නෛතික අවශ්‍යතාවයක් නොවේ.	....

32. පහත එකිනෙක ගනුදෙනුව මගින් ව්‍යාපාරයක හිමිකම **වැඩිවේ** හෝ **අඩුවේ** හෝ **වෙනස් නොවේ** යන්න දක්වන්න.

	ප්‍රකාශය	වැඩිවේ / අඩුවේ / වෙනස් නොවේ
A	වට්ටමකට යටත්ව ණයහිමියෙකුට මුදල් ගෙවීම	....
B	පෙර වර්ෂයක කපාහල බොල්ණය සඳහා මුදල් ලැබීම	....
C	අයිතිකරු තම පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ දුරකථන බිල ගෙවීම	....
D	තොග පරිත්‍යාග කිරීම	....

33. පහත සඳහන් එකිනෙක ගනුදෙනුව වාර්තා කිරීමට අදාල මූලික සටහන් පොත සහ මූලාශ්‍ර ලේඛනය සඳහන් කරන්න.

ගනුදෙනුව	මූලික සටහන් පොත	මූලාශ්‍ර ලේඛනය
1. හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම	....	....
2. ඇසුරුම් ද්‍රව්‍ය ණයට මිලදී ගැනීම	....	....
3. ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම	....	....
4. අයිතිකරු විසින් අමතර ප්‍රාග්ධනය ලෙස මුදල් යෙදවීම	....	....

34. රු. 150,000 ක ලකුණු කළ මිල සහිත භාණ්ඩ තොගයක් මුදලට සහ ණයට විකුණූ අතර, මුදලට විකුණුම් කරන විට ලකුණු කළ මිලෙන් 20% ක වෙළඳ වට්ටමක් ලබා දෙයි. ණයට විකුණුම් කරන විට ලකුණු කළ මිලෙන් 10% ක වෙළඳ වට්ටමක් ලබා දෙයි. ණයට විකුණුම් මත ලබාදුන් වෙළඳ වට්ටම රු. 5000 ක් නම් පහත දෑ වලට පිළිතුරු සපයන්න.

1. ණයට විකුණුම් වලට අදාල ද්විත්ව සටහන

   ....

2. මුදලට විකුණුම්වලට අදාළ ද්විත්ව සටහන

   ....

35. පහත එකිනෙක ගිණුම් වත්කම්, වගකීම්. ආදායම් හෝ වියදම් ලෙස වර්ග කරන්න.

		වර්ගීකරණය
A	ආපසු එවුම්	....
B	ආපසු යැවුම්	....
C	කලින් ලද සාමාජික මුදල්	....
D	ආයෝජන	....

36. මුදල් ගිණුම සංශෝධනය කළ පසු මුදල් ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් වීමට හේතුවිය හැකි කරුණු **දෙකක්** සඳහන් කරන්න.

1. ....
2. ....

37. පහත එකිනෙක අවස්ථාවලදී කඩකර ඇති වඩාත් අදාල වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

		ගිණුම්කරණ සංකල්පය
A	ඉදිරියේදී සේවාවක් සැපයීම වෙනුවෙන් ලද අත්තිකාරම ආදායමක් ලෙස සැලකීම.	....
B	අයිතිකරු සිදුකල භාණ්ඩ ගැනිලි පොත්වල සටහන් නොකිරීම.	....
C	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් ජංගම සහ ජංගම නොවන ලෙස වර්ග නොකිරීම.	....
D	මූල්‍ය කල්බද්දක් යටතේ අත්පත් කරගත් වත්කමක් නීතිමය අයිතිය නොමැති නිසා පොත්වල සටහන් නොකිරීම.	....

38. මධුර ව්‍යාපාරයේ 2019 ජූනි මස සේවක අර්ථසාධක අරමුදල් (EPF) දායකත්වය අඩු කිරීමෙන් පසුව සේවකයන්ට ගෙවූ ශුද්ධ වැටුප රු. 270,000 ක් වන අතර, EPF සඳහා සේව්‍ය හා සේවක දායකත්වයන් දළ වැටුප මත පිළිවෙලින් 15% ක් සහ 10% ක් වේ. සේවක භාරකාර අරමුදල (ETF) සඳහා ආයතනය 3% ක් දායක වේ.

(අ) 2019 ජූනි මාසය සඳහා වැටුප් වියදම කොපමණද?

....

(ආ) 2019. ජූනි මාසය සඳහා සේවකයන් සම්බන්ධ මුළු වියදම කොපමණද?

....

39. වෙළඳ ව්‍යාපාරයක උපචිත පදනම අනුව පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන දෙකක් සඳහන් කරන්න.

1. ....
2. ....

40. පහත වැරදි මගින් අවිනිශ්චිත ගිණුම් ශේෂයක් හට ගනීද, හට නොගනීද යන්න දක්වන්න.

		හට ගනී/හට නොගනී
A	විදුලිය සඳහා ගෙවූ රු. 10,000, විදුලිය වියදම් ගිණුමට බැර කර, මුදල් ගිණුමට හර කිරීම.	....
B	රු. 7000 ක් වූ ආපසු යැවුම්, ආපසු එවුම් ගිණුමට හර කිරීම (ණය හිමි පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර ඇත.)	....
C	රු. 15,000 ක ණයට විකුණුම් ණයගැති ලෙජරයේ පමණක් සටහන් කර ඇත.	....
D	ණය ගැතියන්ගෙන් ලද රු. 25,000, ණය ගැති පාලන ගිනුමට රු. 52,000 ක් ලෙස බැර කිරීම	....

41. පහත සඳහන් පිරිවැය ඍජු පිරිවැයද, වක්‍ර පිරිවැයද යන්න සඳහන් කරන්න. (නිවැරදි තීරුවේ "✓" ලකුණ යොදන්න)

නිෂ්පාදනය	**පිරිවැය**	**ඍජු**	**වක්‍ර**
සපත්තු	i. සම් සඳහා	....	....
	ii. පොලිෂ් හා ඇණ	....	....
	iii. සපත්තු මසන්නාගේ වැටුප	....	....
	iv. යන්ත්‍ර අළුත්වැඩියා වියදම්	....	....
ලී බඩු	i. දැව සඳහා යන වියදම	....	....
	ii. වැලි කඩදාසි	....	....
	iii. ලී ඉරීම සඳහා ගෙවූ වැටුප්	....	....
	iv. දැව ප්‍රවාහනය කිරීමේ වියදම්	....	....

42. පහත තොරතුරු 2018.04.01 දින ආරම්භ කරන ලද '' ගමන් මළු'' නිපදවන අංජලිකාගේ ව්‍යාපාරයට අදාල වේ.

	රු. '000'
අමුද්‍රව්‍ය	1900
ඍජු වැටුප්	600
ඍජු වෙනත් වියදම්	100
2019.03.31 දිනට අමුද්‍රව්‍ය තොගය	200
2019.03.31 දිනට නොනිමි තොගය	400
නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය	1000

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න.

අ). ප්‍රාථමික පිරිවැය : ....

ආ). නිෂ්පාදන පිරිවැය : ....

43. සුරංජිත් ගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනට තොගයේ පිරිවැය රු. 150,000 කි. එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 175,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2019.03.31 දින තොගය වාර්තා කිරීමට අදාල ද්විත්ව සටහන (වටිනාකම සමඟ) දක්වන්න.

....

....

....

44. හවුල් ගිවිසුමක ඇතුළත් කළ හැකි කොන්දේසි **හතරක්** සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

45. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ අයිතිය වෙනස්වන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

1. ....
2. ....

46. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වගන්තිය සම්බන්ධ පහත ප්‍රකාශන ''✓'' ලකුණ යොදමින් **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න.

		සත්‍යයි	**අසත්‍යයි**
A	හවුල්කරුවන්ට වේතන ලබා ගැනීමේ හිමිකමක් ඇත.	....	....
B	හවුල්කුවන්ට හවුල් ව්‍යාපාරය විසින් ලබා දෙන ණය සඳහා 5% ක පොලියක් අයකළ හැකිය.	....	....
C	ලාභාලාභ සමසමව බෙදාගත යුතුය.	....	....
D	හවුල්කරුවන්ට ප්‍රාග්ධන ශේෂ මත පොලී හිමිකමක් නැත.	....	....

47. හවුල් ව්‍යාපාරයක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම යටතේ ඉදිරිපත් කරනු ලබන අයිතම දෙකක් සඳහන් කරන්න.

1. ....

2. ....

48. තනි සටහන් ක්‍රමය යටතේ වාර්තා තබන හේෂලාගේ ව්‍යාපාරයෙන් 2018/19 වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු ලබා ගන්නා ලදි.

	රු.
2018.04.01 දිනට ණයගැතියන්ගේ ශේෂය	55,000
2018.04.01 දිනට ණය හිමියන්ගේ ශේෂය	100,000
ණයගැතියන්ගෙන් ලැබුණු මුදල්	675,000
ණයට ගැණුම්	400,000
2019.03.31 දිනට ණයගැතියන්ගේ ශේෂය	80,000
2019.03.31 දිනට ණයහිමියන්ගේ ශේෂය	100,000

අ). වර්ෂය තුළදී සිදුකළ ණයට විකුණුම් වටිනාකම කොපමණද?

....

ආ). වර්ෂය තුලදී ණයහිමියන්ට ගෙවූ මුදල් වල එකතුව කොපමණද?

....

49. සුහද ක්‍රීඩා සමාජයට අදාලව පහත තොරතුරු ලබාදී ඇත.

2018.04.01 දිනට සිටි සාමාජිකයින් ගණන	100
එක් අයකුගේ මාසික සාමාජික මුදල රු.	500
2018.10.01 දින බඳවා ගත් සාමාජිකයින් ගණන	20

ලැබිය යුතු හා කලින් ලද සාමාජික මුදල් මෙසේය.

	2019.03.31 දිනට (රු.)	**2018.04.01 දිනට (රු.)**
ලැබිය යුතු සාමාජික මුදල්	50,000	10,000
කලින් ලද සාමාජික මුදල්	30,000	25,000

අ). 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ආදායම කොපමණද? ....

ආ). 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල කොපමණද? ....

50. ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය හා ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ආදායම් ප්‍රකාශනය අතර ඔබ දකින් සමානකමක් හා අසමානකමක් බැගින් දක්වන්න.

		ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය	**ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ආදායම් ප්‍රකාශනය**
1	සමානකම	....	....
		....	....
2	අසමානකම	....	....
		....	....

❋❋❋

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

33 | S | II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 12 - 2019

ගිණුම්කරණය II

කාලය පැය තුනයි විනාඩි 10 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10)

උපදෙස්

- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහක ට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාල පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

01 අමල්, බිමල් සහ චමෝද් 2018.04.01 දින හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත කොන්දේසි ඇතුලත් වේ.

- අමල්, බිමල් හා චමෝද් අතර ලාභාලාභ 2:2:1 අනුපාතයට බෙදාගැනේ.
- සෑම හවුල්කරුවකුටම මසකට රු. 20000 ක වේතනයක් හිමිවේ.
- හවුල්කරුවන් යොදන ප්‍රාග්ධනය වෙනුවෙන් 10% ක වාර්ෂික පොලියක් හිමිවේ.
- හවුල්කරුවන් විසින් ලබාදෙනු ලබන ණය සඳහා වාර්ෂිකව 20% ක වාර්ෂික පොලියක් හිමිවේ.
- හවුල්කරුවන්ට අදාල සියලු ගනුදෙනු ඔවුන්ගේ ජංගම ගිණුම් මගින් සිදුකරනු ලබයි.

2019.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත වේ.

ශේෂ පිරික්සුම

විස්තරය		හර රු.'000	බැර රු. '000
විකුණුම්			2300
ගැනුම්		1380	
වෙළඳ ලැබිය යුතු දෑ		300	
වෙළෙඳ ගෙවිය යුතු දෑ			250
ප්‍රාග්ධන ගිණුම්	අමල්		600
	බිමල්		600
	චමෝද්		500
දේපළ, පිරියත හා උපකරණ (ධාරණ අගය)		1600	
දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය		200	
බෙදාහැරීමේ වියදම්		120	
පරිපාලන වියදම්		75	
හවුල්කරුවන්ට ගෙවූ වේතන		360	
මුදල්		215	
		4250	**4250**

අතිරේක තොරතුරු.

i) 2019.03.31 දිනට තොගයේ පිරිවැය රු. 250,000 ක් වූ අතර එහි ශුද්ධ උපලබ්ධි අගය 200,000 කි.

ii) හවුල්කරුවන්ට ගෙවූ වේතන වලින් නිරූපණය වන්නේ හවුල්කරුවන් තිදෙනාට මාස 6 ක් සඳහා ගෙවූ වේතන වේ.

iii) අමල් විසින් 2018.10.01 දින රු. 200,000 ක් ණය මුදලක් ලබාදී ඇත. ඒ සම්බන්ධ කිසිදු සටහනක් පොත්වල තබා නැත.

iv) 2019.01.01 දින බිමල් ට අයත් ගොඩනැගිල්ලක් ප්‍රදර්ශනාගාරය සඳහා ව්‍යාපාරයට කුලියට දෙන ලදි. ඒ සඳහා ගෙවූ වාර්ෂික කුලිය වූ රු. 60,000 ක් පරිපාලන වියදම් තුළ ඇතුලත් වේ.

v) 2019.10.01 චමෝද් විසින් රු. 200,000 ක අතිරේක ප්‍රාග්ධනයක් හවුල් ව්‍යාපාරයට ලබාදෙන ලදි. ඒ පිළිබඳ සටහනක් පොත්වල තබා නැත.

vi) හවුල් ව්‍යාපාරය එකතුකළ අගය මත බදු (VAT) ලියාපදිංචි වී ඇත. ගැනුම් හා විකුණුම් වටිනාකම් තුළ 15% ක VAT අතුලත්ය.

vii) බිමල් විසින් රු. 8000 ක භාණ්ඩ ගැනිලි කර ඇත. ඒ පිළිබඳ කිසිදු සටහනක් පොත්වල තබා නැත.

අවශ්‍ය වන්නේ,

1) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන්ද සහිතව)

2). 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම්

3). 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(ලකුණු 20)**

02. ඉසුරු ලොතරැයි දිනුමකින් ලද රු. 2,000,000 කින් රු. 1,500,000 ක් ආයෝජනය කරමින් ''ඉසුරු'' යෝගට් නමින් යෝගට් නිපදවීමේ ව්‍යාපාරයක් 2019.04.01 දින ආරම්භ කරන ලදි. 2019 අප්‍රේල් මාසය තුළදී සිදුකරන ලද එම ගනුදෙනුවල සාරාංශය පහත වේ.

i)

		(රු. 000)
මුදල් ලැබීම්		
විකුණුම්		10000
ණයගැති ලැබීම්		9000
මුදල් ගෙවීම්		
යන්ත්‍ර මිලට ගැනුම් (2019.04.01 දින)		8000
ගැනුම් අමුද්‍රව්‍ය	සෘජු	2000
	වක්‍ර	400
ණය හිමියන්ට ගෙවීම		4000
වැටුප් ගෙවීම්		1200
කම්හල් වරිපනම් හා රක්‍ෂණ		100
කම්හල් විදුලිය		40
ගොඩනැගිලි කුලි		600
බෙදාහැරීමේ වියදම්		160
අනෙකුත් පරිපාලන වියදම්		150

ii) අනෙකුත් මූලික සටහන් පොත්වල එකතුන්,

	(රු. 000)
ගැනුම් ජර්නලය	6000
විකුණුම් ජර්නලය	15500
ආපසු එවුම් ජර්නලය	500

iii) ගෙවූ වැටුප් වල සංයුතිය පහත පරිදි වේ.

	(රු. 000)
සෘජු වැටුප්	800
සුපරීක්‍ෂක හා ආරක්‍ෂක	300
පරිපාලන	100
	1200

iv) යන්ත්‍රයේ ඵලදායි ජීවකාලය වසර 10 ක් වන අතර, සුන්බුන් අගය රු. 800,000 කි. යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.

v) ගෙවූ ගොඩනැගිලි කුලි තුලින් නිරූපණය වන්නේ මාස 6 ක් සඳහා ගෙවූ කුලියයි. ගොඩනැගිලි කුලියෙන් $\frac{3}{4}$ ක් කර්මාන්ත ශාලාවට ද, $\frac{1}{4}$ ක් කාර්යාලයට ද, අයත් වේ.

vi) ණයගැතියන්ට දුන් වට්ටම් හා ණයගැතියන්ගෙන් කපා හළ බොල්ණය පිළිවෙලින් රු. 100,000 ක් හා රු. 200,000 ක් වේ.

vii) මාසය අවසානයේ දී තොග ශේෂයන් පහත පරිදි වේ.

	(රු. 000)
අමුද්‍රව්‍ය	400
නොනිමි	100
නිමි	200

අවශ්‍ය වන්නේ,

1) 2019 අප්‍රේල් මාසය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනය
2). 2019 අප්‍රේල් මාසය සඳහා පොදු ලෙජරයේ පහත ගිණුම්
   i. විකුණුම් ii. අමුද්‍රව්‍ය ගැනුම්
   iii. දුන් වට්ටම් ගිණුම iv. බොල්ණය ගිණුම
3) 2019 අප්‍රේල් මාසය සඳහා අදායම් ප්‍රකාශනය
4) 2019 අප්‍රේල් 30 දිනට පහත අයිතම වල අගයන්
   i. යන්ත්‍ර ධාරණ අගය ii. වෙළඳ ලැබිය යුතු දෑ iii. වෙළඳ ගෙවිය යුතු දෑ
   iv. ඉදිරියට ගෙවූ වියදම් v. හිමිකම් **(මුළු ලකුණු 20)**

03. ලක්සිරි ව්‍යාපාරයේ 2019 ජූනි මාසයේ 01 දිනට තිබූ වත්කම්, වගකීම් හා හිමිකම් ද ජූනි මාසයේ මුල් සතිය තුළ ඒවායේ ඇති වූ වෙනස්වීම් පහත දැක්වේ.

වත්කම්	06/01 (රු. 000)	06/02 (රු. 000)	06/03 (රු. 000)	06/04 (රු. 000)	06/05 (රු. 000)	06/06 (රු. 000)	06/07 (රු. 000)
දේපළ, පිරියත හා උපකරණ	5000	5000	5000	5000	5000	5000	4980
තොගය	2000	3000	2500	2500	2500	2500	2500
වෙළඳ ලැබිය යුතු දෑ	1000	1000	1400	1400	1350	1350	1350
ඉදිරියට ගෙවූ වියදම්	-	-	-	-	-	100	100
මුදල්	3000	3000	3300	2400	2400	2000	2000
	11000	**12000**	**12200**	**11300**	**11250**	**10950**	**10930**
හිමිකම් සහ වගකීම්							
ප්‍රාග්ධනය	5000	5000	5000	5000	5000	5000	5000
රඳවාගත් ඉපයුම්	1000	1000	1200	1300	1250	1150	1130
බැංකු ණය	3000	3000	3000	3000	3000	3000	3000
වෙළෙඳ ගෙවිය යුතු දෑ	1800	2800	2800	1800	1800	1800	1800
උපචිත වියදම්	200	200	200	200	200	-	-
	11000	**12000**	**12200**	**11300**	**11250**	**10950**	**10930**

අවශ්‍ය වන්නේ,

1) ජූනි 02 සිට ජූනි 07 දක්වා එක් එක් දිනවල සිදුවූ ගනුදෙනු විස්තරාත්මකව වෙන් වෙන්ව ලියන්න.
2) එම ගනුදෙනු මූලික ගිණුම්කරණ සමීකරණය තුළ දක්වන්න. ඒ සඳහා පහත ආකෘතිය භාවිත කරන්න (වැඩිවේ නම් (+) ද අඩුවේ නම් (-) සඳහන් කරන්න.

ගනුදෙනු සිදු වූ දිනය

6/1 ශේෂ	වත්කම්	=	වගකීම්	+	හිමිකම්
6/2	....	=	....	+	....

3) 2019.06.07 දිනෙන් අවසන් සතිය සඳහා ආදායම් ප්‍රකාශනය
4) 2019.06.07 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(ලකුණු 20)**

04. එකතුකළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි නොවූ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන බණ්ඩාරගේ ව්‍යාපාරයේ 2019 මැයි මාසය සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් ජර්නල් වලින් උපුටා ගැනීම පහත දැක්වේ.

i) මුදල් ලැබීම්

දිනය	විස්තරය	චෙක්පත් අංකය	දුන් වට්ටම් (රු.)	වටිනාකම (රු.)
05/01	විකුණුම්	-	-	50000
05/08	මහේලගෙන් ලැබීම්	073415	2000	18000
05/15	විකුණුම්	432850	-	30000
05/22	කුමාර්ගෙන් ලැබීම්	-	1000	9000
05/30	කොමිස් ආදායම් ලැබීම්	254350	-	5000
	එකතුව		**3000**	**112000**

මුදල් ලැබීම්

දිනය	විස්තරය	චෙක්පත් අංකය	ලද වට්ටම් (රු.)	වටිනාකම (රු.)
05/05	ගැනුම්	003201	-	25000
05/10	රාජාට ගෙවීම්	003202	800	7200
05/12	විදුලි බිල් ගෙවීම්	003203	-	4000
05/20	රාණිට ගෙවීම්	003204	300	2700
05/28	ගැනිලි	003205	-	1500
	එකතුව	-	1100	40400

ii) බණ්ඩාරගේ ව්‍යාපාරයේ 2019.05.01 දිනට පැවති ශේෂ හා මැයි මාසය සඳහා මූලික සටහන් පොත් වලින් උපුටා ගත් තොරතුරු පහත වේ.

විස්තරය	මහේල	කුමාර්	කුසල්
ණයගැති ශේෂ 2019.05.01	12000	8000	5000
විකුණුම් ජර්නලයෙන්	25000	7000	6000
ආපසු එවුම් ජර්නලයෙන්	3000	-	1500
පොදු ජර්නලයෙන් (බොල්ණය කපාහැරීම)	-	5000	-

විස්තරය	රාජා	රාණි	බාලා
ණය හිමි ශේෂ 2019.05.01	3000	2000	-
ගැණුම් ජර්නලයෙන්	22000	5000	15000
ආපසු යැවුම් ජර්නලයෙන්	2000	-	3000

අමතර තොරතුරු,

- 2019.05.01 දිනට මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 15400 ක් විය. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂයද එයට සමාන විය.
- 2019 මැයි මාසයේ මුදල් පාලන ගිණුම පිළියෙළ කිරීමේදී පහත වැරදි හා මඟහැරීම් සිදු වී ඇත.

1. කොමිස් ආදායම් ලැබීම් මුදල් පාලන ගිණුමේ ලියා තිබුණේ රු. 500 ක් ලෙසය.
2. 05/22 දින කුමාර්ගෙන් ලැබී තැම්පත් කළ චෙක්පත අගරු වී ඇති බව බැංකුව විසින් දන්වන ලදි. දුන් වට්ටම අහිමි කළ බව ඔහුට දන්වා යැවීය. මේ පිළිබඳ කිසිදු සටහනක් මුදල් පාලන ගිණුමේ දක්වා නැත.
3. ණයගැති කුසල් විසින් සෘජුවම ප්‍රේෂණය කරන ලද මුදල රු. 5000 කි. වන අතර බැංකුව අයකළ බැංකු ගාස්තු රු. 500 කි. ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ වාරිකය රු. 2000 කි.
4. රාණිට ගෙවන ලද චෙක්පත මෙතෙක් බැංකුවට ඉදිරිපත් කර නැත.

අවශ්‍ය වන්නේ,

1) ඉහත වැරදි හා මග හැරීම් සිදුකිරීමට පෙර ව්‍යාපාරය විසින් පිළියෙල කරන ලද මුදල් පාලන ගිණුම
2) සංශෝධිත මුදල් පාලන ගිණුම
3) 2019 මැයි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය
4) 2019 මැයි 31 දිනට නිවැරදි ණයගැති පාලන ගිණුමේ හා ණය හිමි පාලන ගිණුමේ ශේෂය

(ලකුණු 20)

05. වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන රුචිරගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම තුලනය නොවීය. එදිනට පිළියෙල කරනු ලැබූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන වලට අනුව ශුද්ධ ලාභය රු. 960,000 ක් විය. පසුව සිදුකරන ලද ගිණුම් පරීක්ෂාවේදී පහත වැරදි හා මග හැරීම් සිදුවී ඇත. ව්‍යාපාරය VAT බදු සඳහා ලියා පදිංචි වූවකි. VAT ප්‍රතිශතය 15% කි.

i) ණය හිමියන්ට ආපසු යැවූ භාණ්ඩවල VAT සහිත වටිනාකම රු. 9200 ක් සම්පූර්ණයෙන්ම ආපසු යැවුම් ගිණුමේ හා ණය හිමිපාලන ගිණුමේ වාර්තා කර තිබුණි.
ii) මුදල් ලැබීම් ජර්නලයේ වට්ටම් තීරුවේ එකතුව වූ රු. 12000 ක් පොදු ලෙජරයේ අදාල ගිණුම් දෙකටම හර කර තිබුණි.
iii) වෙළෙඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ රු. 20,000 ක් පිළිබඳ කිසිදු සටහනක් තබා නැත.
iv) කාර්යාල ලී බඩු අළුත් වැඩියා සඳහා ගෙවූ රු. 60,000 ක් කාර්යාල උපකරණ ගිණුමට රු. 600,000 ක් ලෙස හරකර ඇත. ඒ වෙනුවෙන් ක්ෂය වීම් ලෙස රු. 30,000 ක් ගිණුම්ගත කර ඇත.
v) ඉදිරි වර්ෂයට බලපාන පරිදි ලැබුණු රු. 115000 ක විකුණුම් අත්තිකාරකමක් විකුණුම් ගිණුමට හා VAT ගිණුමට බැර කර මුදල් පාලන ගිණුමට හර කර ඇත.
vi) ගොඩනැගිලි ගිණුමේ ශේෂය වූ රු. 300,000 ශේෂ පිරික්සුමේ දක්වා නැත.
vii) ගෙවූ පොලී රු. 8000 ක් ලද පොලී ගිණුමට බැරකර ඇත.
viii) රු. 69000 ක වටිනාකමින් යුත් විකුණුම් ඉන්වොයිසියක් මගහැරී ඇත.
ix) ගෙවූ විදුලි වියදම් රු. 15000 ක් මුදල් ගෙවීම් ජර්නලයේ දෙවරක් සටහන් කර ඇත.

අවශ්‍ය වන්නේ,

1). ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්.
2). 2019.03.31 දිනට නිවැරදි ශුද්ධ ලාභය
3). අවිනිශ්චිත ගිණුම

(ලකුණු 20)

06. පහත දැක්වෙන්නේ ''පඬු අබා'' ක්‍රීඩා සමාජයේ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ පිළියෙල කරන ලද මුදල් ගිණුමයි.

මුදල් ගිණුම

	(රු.000)		(රු.000)
2018.04.01 ශේෂය	3600	ක්‍රීඩා උපකරණ මිලට ගැනුම්	800
සාමාජික මුදල්	1000	ක්‍රීඩා පිටිය නඩත්තු	1200
ක්‍රීඩා තරග ආදායම්	400	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	150
පරිත්‍යාග	500	ක්‍රීඩාංගන භාරකරු වැටුප්	240
ක්‍රීඩා පිටිය කුලියට දීම	200	ගිණුම් ලිපිකරු වැටුප්	360
		ක්‍රීඩා තරග වියදම්	250
		විදුලි බිල්	50
		අනෙකුත් වියදම්	350
		2019.03.31 ශේෂය	2300
	5700		**5700**

අතිරේක තොරතුරු

1. 2018.04.01 දිනට හා 2019.03.31 දිනට ක්‍රීඩා සමාජය සතු වත්කම් හා වගකීම් සමහරක් පහත වේ.

	2019.03.31 (රු.000)	2018.04.01 (රු.000)
ක්‍රීඩා පිටිය	5000	5000
ක්‍රීඩා උපකරණ	1500	1200
ඉදිරියට ගෙවූ මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	50	40
උපචිත විදුලිය	10	8
හිඟ සාමාජික මුදල්	440	120
කලින් ලද සාමාජික මුදල්	60	180

2. ලැබූ පරිත්‍යාග වලින් 80% ක් ක්‍රීඩාගාරයක් ඉදිකිරීමට ලැබූ මුදලකි.
3. ක්‍රීඩාපිටියේ කුලී ආදායමෙන් රු. 50,000 ක් ඉදිරි වර්ෂය සඳහා වේ.

අවශ්‍ය වන්නේ,

1) 2018.04.01 දිනට ක්‍රීඩා සමාජයේ සමුච්චිත අරමුදල
2) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ගිණුම
3) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
4) 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(මුළු ලකුණු 20)**